**සිංහල භාෂාව හා සාහිත්‍යය තරග 2024(කලාප)**

අපේක්ෂකයාගේ නම- ------------------------------------------------------------------------------------------------
(මුලකුරු සමග නම)

පාසලේ නම හා ලිපිනය- ------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------

පාසල් වර්ගය- 200 ට අඩු / 201-500 / 501 ට වැඩි

කොට්ඨාසය- ------------------------------------------------------------------------------------------------------

කලාපය- ---------------------------------------------------------------------------------------------------------

භාෂා භාවිතය හා අවබෝධය

10 ශ්‍රේණිය කාලය පැය 03 (මුළු ලකුණු 100)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) සදොස් අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා නිවැරදි වචනය ලියා දක්වන්න.

I පියුම හෙවත් නෙලුම පොකුණ අලංකාර කරයි.
II දේශීය සංස්කෘතියේ පදනම බෞද්ධ විහාරස්තානයයි.
III මුවින් නිකුත් වන ශබ්ද ලියා දක්වන දෘෂ්ඨිගෝචර සංකේත අක්ෂර ලෙස හැඳින්වේ.
IV උක්ත නඩුව සම්බන්ධ අධිකරණ කටයුතු විමර්ෂණය කිරීමට විශේෂ කමිටුවක් පත් කරන ලදී.
V පසුගිය සාමාන්‍ය පෙළ විභාගයෙන් දර්ශනී විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබුවා ය.

**(ලකුණු 5x2 = 10යි)**

**(02) පහත පදවලට යෝග්‍ය සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද ලියා දක්වන්න.**

| | සමානාර්ථ පද | විරුද්ධාර්ථ පද |
|---|---|---|
| I අධම | ----------------- | --------------------- |
| II නුඹ | ----------------- | --------------------- |
| III අනවරත | ----------------- | --------------------- |
| IV සකි | ----------------- | --------------------- |
| V ඡන්දය | ----------------- | --------------------- |

**(ලකුණු 2x5 = 10යි)**

(03) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

I දඩයක්කාරයෝ සතුන් මරති.
II ගුරුතුමා නිරන්තරයෙන් ශිෂ්‍යයන් දැනුවත් කළේ ය.
III ධනවත්තු සිය දරුවන් ව්‍යාපාර අධ්‍යනය සඳහා යොමු කරති.
IV දේශපාලඥයා සභාව ආමන්ත්‍රණය කරයි.
V ශිෂ්‍යයෝ පින්තූර බලති.

**(ලකුණු 2x5 = 10යි)**

**(04)පහත දැක්වෙන පද අයත් වන ව්‍යාකරණ වර්ගය ලියා දක්වන්න.**

I ගායනා කොට
II විලස
III කරවයි
IV නරඹමින්
V පැවසුවොත්

**(ලකුණු 2x5 = 10යි)**

**(05) පහත දැක්වෙන පදවල ප්‍රකෘති සහ ප්‍රත්‍යය වෙන් කර ලියන්න.**

| | | | |
|---|---|---|---|
| I ළමයෙක් | ------------------------ | VI කරනු | ------------------------- |
| II තොටියා | ------------------------ | VII කාන්තාවක | ------------------------- |
| III දැහැමි | ----------------------- | VIIIකැඩුණු | ------------------------- |
| IV ගුණවත් | ------------------------ | IX ගුරුවරයා | ------------------------ |
| V කුමරා | ------------------------ | X මලණු | ------------------------- |

**(ලකුණු 1x10 = 10යි)**

(06) තනි පද ලියන්න.

I ස්වාමියා මළ ස්ත්‍රිය
II බිජුවෙන් උපන්
III ඇතා විසින් කරන නාදය
IV යකඩයෙන් කරන ලද
V බොහෝ ඇසූ පිරූ තැන් ඇති

**(ලකුණු 2x05 = 10යි)**

(07) පහත අක්ෂර වර්ග නම් කර ලියන්න.

I අ, ඇ, ඉ, උ
II (අ)ං
III ය, ර, ල, ව
IV (අ)ඃ, ශ,ෂ,ස,හ,ෆ
V ක,ච,ට,ත,ප

**(ලකුණු 2x5 = 10යි)**

**(08)පහත දැක්වෙන වචන අකාරාදී පිළිවෙලට සකස් කරන්න.**

I උපමාලංකාර , රූපකාලංකාර, ජනකවි, ජනකතා
II නිකාය, භික්ෂුව,අස්ගිරි,මල්වතු
III විෂයය,විද්‍යාව,විවේකය,විනා ශය
IV ආලවක, ආසනය,අශ්විද,ඇත්ගොව්වා
V වෙළෙන්දෝ,ගායකයෝ,ශිෂ්‍යයෝ,සංචාරකයෝ

**(ලකුණු 2x5 = 10යි)**

**(09)පහත ඡේදය වචන 40-50 අතර වන සේ සාරාංශ කර ලියන්න.**

අවට ඇති පරිසරය අපට ලැබෙන සියලු ම සංවේදන ඇතුළු වන දොරටු වශයෙන් සැලකිය හැක්කේ ඇස්,කන්,නාසා ආදි ඉන්ද්‍රියයන් ය. මොළය සමග මේ ඉන්ද්‍රියයන් ස්නායු මගින් සම්බන්ධ වී ඇත.ඒවා මගින් උත්තේජනයක් නොලැබේ නම් ප්‍රතික්‍රියා ද ලැබෙන්නේ නැත.සංගීතයක් රසවිඳින විට මනසේ ඇති වන ක්‍රියාකාරීත්වය විස්තර කිරීමට පෙර රසාස්වාදයට තුඩු දෙන භාව උපදින මිනිස් මොළයේ ඇති ශ්‍රවණ මධ්‍යස්ථානය සහ ක්‍රියාකාරිත්වයන් සැකෙවින් සාකච්ඡාවට භාජනය කිරීම වටී. මොළයේ ඇති වෙනත් මධ්‍යස්ථාන සහ ශ්‍රවණ මධ්‍යස්ථානය අතර සම්බන්ධතාවයක් ඇත.උදාහරණයක් වශයෙන් ස්මරණ මධ්‍යස්ථානය හා දෘෂ්ටික මධ්‍යස්ථානය අතර ඇති සම්බන්ධතාවය සඳහන් කළ හැකි ය.ඇසට පෙනෙන දෙය ඇසේ ඇති දෘෂ්ටිවිතානයේ ප්‍රතිබිම්බය මෙන් පතිත වේ.මේ ප්‍රතිබිම්බයේ සංවේදනය දෘෂ්ටි මධ්‍යස්ථානය කරා ගෙන යන්නේ දෘෂ්ටි ස්නායුව මගිනි.

**(ලකුණු 10යි)**

**(10)පහත දැක්වෙන කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

දැමූ තැන් අප මුතුන් සරිලක පමණ නැති
සඳකැන් සෙලින් කොත් බඳිනට සුදුසු වෙති
දැන ගන්නට මගක් දැන් අප හට නොමැති
එබැවින් සිතින් වත් බුහුමන් කරමු නිති

තණ කන මුවා නොවිද ම එළවන්න සිතූ
ගුණ නැණ ලොවාසින් හට දැක් වූ අමුතු
පිනවන දෙවා සුර බඹ සත් කිත් දිමුතු
සිතු දින පවා සැපතකි මුත් නන් මෙයුතු

I මේ කවි පෙළින් කිසියම් සාරධර්මයක් ඉස්මතු වේ.ඒ කුමක් ද?

II ' දැමූ තැන් අප මුතුන් සරිලක පමණ නැති'යන්නෙහි අදහස දක්වන්න.

III මෙහි සුවිශේෂ ව කියාපාන ගුණවත්කම කුමක් ද?

IV 'පිනවන දෙවා සුර බඹ සත් කිත් දිමුතු' යන පද පේළියෙහි අදහස ලියන්න.

V (අ) සෙලින් (ආ) කිත් යන පදවල අරුත් පැහැදිලි කරන්න.

(ලකුණු 2x5 = 10යි)